# සාරාංශය


### ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුවේ න්‍යාය පත්‍රයන්ට අනුව

# පෞද්ගලීකරණය

# “දූෂිත ගනුදෙනු” ශ්‍රී ලංකාවේ කිනම් ‘විරෝධාභාසයක්ද’!

***Google Books** – ‘IMF, World Bank & ADB Agenda on Privatisation – Vol. 2:‘Dubious Deals’ in Sri Lanka – What a Paradox!’*

*http://www.consultants21.com/fraud-&-corruption-exposures-new.php*




*විශාලත්වය - 8.25” X 11” - පිටු ගණන 596*

කර්තෘ විසින්, මෙම ග්‍රන්ථය ‘සැක සහිත ගනුදෙනු’ (Dubious Deals) ලෙස නම් කරමින්, රජයේ සැබෑ ගනුදෙනු සහ වෙනත් කාර්යයන් ගැඹුරු ලෙසට විමර්ශනය කර, පුදුමයට පත්කරවන ලෙස අදාල කරුණු ඔහු විසින් අනාවරණය කර ගෙන, රජය විසින් සිදුකල සැක සහිත මහා පරිමාණ දූෂිත ගනුදෙනු වල තත්වයන් හෙළිදරව් කරමින්, දේශපාලනික සහ සමාජයීය යථාර්ථය මෙම ග්‍රන්ථය මගින් මනාසේ පැහැදිලි කර ඇත.

දේශපාලඥයන් දේශපාලන වේදිකා වලට ගොඩ වැදී බලයට පත්වීමේ අපේක්ෂාවෙන්, වංචාවලට සහ දූෂණයට එරෙහිව මහා හඬ නැගුවත්, ඔවුන් දේශපාලන බලයට පත් වූ විගසම, ඊට හාත්පසින්ම වෙනස් ආකාරයකට ක්‍රියා කරන්නේ, තම අරමුණ ඉටුකර ගැනීමට ඔවුන්ව බලයට පත්කල දුගී දුප්පත් ජනතාව පත්ව සිටින අසීරු ආර්ථික තත්වයන් නොසලකමිනි.

මහජන දේපල ගනුදෙනු වලදී එවැනි හැසිරීම සහ ක්‍රියාවන් සමඟම, මවිතයට පත්කර වන ලෙස ඔවුන් වංචාවට සහ දූෂණයට ලැජ්ජා සහගත ලෙස යොමු වන්නන් ලෙස කටයුතු කල අතර, එසේ වංචා සහ දූෂණ විවේචනය කල දේශපාලඥයින්ම, වංචා සහ දූෂණ මඩේ එරීමේ ඛේදජනක යථාර්ථය මෙම ග්‍රන්ථයෙන් මනා ලෙස අනාවරණය වේ.

ඉහත කී තත්වය දිරිගැන්වීමේ සාධකයන් වන්නේ, මැතිවරණ සමයේදී දේශපාලන බලයට ඒමට දේශපාලඥයන් විසින් ව්‍යාපාරික තැරැව්කරුවන් ගෙන් අරමුදල් සහ සහාය ලබා ගැනීමේ හේතුවෙන්, දේශපාලඥයන් බලයට පත් වූ විගසම, එම ව්‍යාපාරික තැරව්කරුවන්ගෙන් ලබා ගත් මූල්‍ය උපකාර වෙනුවෙන්, තම ජයග්‍රහණයන් මගින් ඔවුන්හට ප්‍රතිලාභ ලබා ගැනීමට උදව් කිරීමට අනිවාර්යයෙන්ම ගොදුරු වීමය. මෙවැනි ක්‍රියාදාමයන් නිසා දුප්පතුන් තව තවත් දුගීභාවයට පත් වී අසරණ වන්නේ, ඔවුන්ගේ ඡන්ද බලයේ වටිනාකමේ අගයද නොතකමිනි.

මෙම ග්‍රන්ථයෙන් නොයෙක් ගනුදෙනු පිළිබඳ විමර්ශනය කල තොරතුරු පාඨකයන් මවිතයට පත් කරවමින් එළිදරව් කර ඇති අතර, මෙම ගනුදෙනු, දේශපාලඥයන් සහ රජයේ ඉහල නිලධාරීන් විසින් තනි තනිව කරන ඒවා නොවන නමුදු, අනිවාර්යයෙන්ම ඒවා කිරීමට පොළඹවා ඇත්තේ දේශීය සහ විදේශීය කූට ව්‍යාපාරික බලවතුන් සහ එම තැරැව්කරුවන් බවත් පැහැදිලි ලෙස හෙලි වේ.

එමගින් කර්තෘ විසින් පෙන්වා දී ඇති පරිදි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව (World Bank) සහ ආසියානු සංවර්ධන බැංකු (ADB) වල න්‍යාය පත්‍රයන්ට අනුව, ඔවුන්ගේ අනුග්‍රහය යටතේ, ශ්‍රී ලංකාව පෞද්ගලීකරණයට පෙළඹවීම නිසා, ඇතිකර ගන්නා රජයේ දේපල විකිණීමේ ගනුදෙනු මගින් මහා වංචනික සහ දූෂිත මගඩි සිදුවීමද, එමගින් මේ ජාත්‍යන්තර ආයතනයන්හි නියම අරමුණු උවදුරෙහි හෙලමින්, සමහර ගනුදෙනු නීති විරෝධී සහ වංචා සහගත වීම, සහ පෞද්ගලීකරණය මුවාවෙන් ඇතැම් ගනුදෙනු, නීති විරෝධී, වංචනික සහ දූෂිත වී ඇති බව අනාවරණය කරනු ලබයි.

මුලින්ම මෙම ග්‍රන්ථයෙන් කර්තෘ විසින් එළිදරව් කර ඇත්තේ චන්ද්‍රිකා කුමාරතුංග 1994 නොවැම්බර් මස ජනාධිපතිනිය ලෙස බලයට පත්වීමත් සමගම, ඇය විසින්ම මුදල් අමාත්‍ය ධූරයද දරමින්, එවකට මුදල් අමාත්‍යාංශයේ ලේකම් ඒ. එස්. ජයවර්ධන මගින් කර්තෘව මුදල් අමාත්‍යාංශයේ උපදේශකයෙකු ලෙස කටයුතු කිරීමට කැමති කරවා ගන්නා ලද බවයි. ඉන් අනතුරුව, 1995 ජනවාරි මස ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශය මෙම ග්‍රන්ථයේ සම්පූර්ණයෙන්ම අඩංගු කර ඇත.

# Policy Statement

by
Her Excellency
**Chandrika Bandaranaike Kumaratunga**
President of the
Democratic Socialist Republic of Sri Lanka

1995


එම ප්‍රතිපත්ති ප්‍රකාශය සැබවින්ම සිහින මැවූ සුරංගනා කතාවක් වූ අතර, එසේ වූයේ, ඊට පෙර රජය විසින් සිදුකල විශේෂයෙන්ම මහජන දේපල පෞද්ගලීකරණයේදී හෝ විකිණීමේදී රජයේ දේපල මංකොල්ලකෑම ඉහත කී ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් තරයේ විවේචනය කර තිබුනත්, පසුව එහි යථාර්ථය වූ පරිදි, විකාරයක් සේ, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ රජයද ඒ හා සමාන දූෂිත ආකාරයට රජයේ දේපල මංකොල්ලකෑම පිළිබඳව වංචා සහ දූෂණ එළිදරව් වීම වන අතර, එය මවිතයට පත්කරවන කරුණකි.

එය එසේ සිදුවේ යැයි කර්තෘ විසින් කලින්ම වටහා ගත් අතර, ඒ විගසම 1995 පෙබරවාරි මස මුල් කාලයේදී කර්තෘ විසින්, ඔහුට උපදේශක තනතුරින් ඉවත් වන්නට අවශ්‍ය වූ බව මුදල් අමාත්‍ය ලේකම් ඒ. එස්. ජයවර්ධන හට දැනුම්දී තිබුණි. ඒ අනුව කර්තෘ මුදල් අමාත්‍යාංශයේ උපදේශක ධූරයෙන් ඉවත් වූයේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගගේ විරුද්ධත්වයද නොසලකමිනි.

කර්තෘ එම ධූරයෙන් අස්වීමෙන්, වර්ෂයකට පසුව රජයට සහ මහජනතාවට මහා පරිමාණ අලාභ සිදුකරමින්, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින් පත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් සිදු කල ක්‍රියාවන්, විශේෂයෙන් වංචනික සහ දූෂිත ලෙස වතුයායන් පෞද්ගලීකරණය සහ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ බදු රහිත මත්පැන් අලෙවි සැල පෞද්ගලීකරණය පිළිබඳ කරුණු එළිදරව් කරමින්, එම ක්‍රියාවන් මගින් ඉහත කී ඇයගේ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කල බව ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගට පෙන්වා දෙමින්, කර්තෘ විසින් 1996 ජනවාරි මස ඇය වෙත ලේඛනයක් ඉදිරිපත් කරමින් එහි යථාර්ථයන් විවේචනයට ලක්කොට ඇත.

ඊට අමතරව, කර්තෘ විසින් 1999 ජනවාරි මාසයේ මාධ්‍යයේ පල කර තිබූ විවේචනයන් උපුටා ගනිමින්, මෙම ග්‍රන්ථයේ මීලඟ පරිච්ඡේදයෙන් උපුටා ගත් පැහැදිලි ආදර්ශනයන් සමඟ විස්තරාත්මක සාධක අඩංගු කරමින්, සවිස්තරාත්මකව දේශපාලන ක්ෂේත්‍රයේ භීෂණය විවේචනය කිරීම පිලිබඳව දෙබිඩි පිළිවෙත් මනාසේ එළිදරව් කරන ලද අතර, එහි ප්‍රධාන මාතෘකාවක් වූයේ පෙර පැවති රජය සමයේ භීෂණය වළක්වාලීම සන්සන්දනාත්මකව සැලකීමේදී, එකල පැවත් වූ වයඹ පලාත් සභා ඡන්දයේදී භීතිය විවෘතව රජ කිරීම සහ නීතියේ ආධිපත්‍යය උඩු යටිකුරු කිරීමය.

මෙලෙස තවත් උපුටාගත් පරිච්ඡේදයකින් සත්‍ය සහ යථාර්ථය එළිදරව් කරමින්, එලෙසම ඉහත කී පරිදි කර්තෘ විසින් 1999 ජනවාරි මාසයේ මාධ්‍යයේ පල කර තිබූ විවේචනයන් උපුටා ගනිමින් සඳහන් කර තිබුණේ, ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සැකසුණු ආකාරයත්, එහි අවසාන මොහොතේදී ඉන්දියානු අගමැති අතල් බිහාරි වජ්පායි සහ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග අතර ඇතිවූ රහසිගත සාකච්ඡාවකට පසුව, කලින් දෙරටෙහි නිලධාරීන් ඒ වනවිටත් එකඟතාවයකට පත්ව සිටි සමහර වැදගත් කොන්දේසි ඉවත් කරමින්, දෙරට අතර ඇති කර ගන්නා ගිවිසුම් වලින්, ස්වාධීන රටවල් දෙකක් අතර බදු සහන සඳහා සමාන ගිවිසුම් සකස් කිරීම සිදු විය යුතු වුවත්; එසේ නොව, ප්‍රාන්ත ගණනාවකින් සමන්විත රටක් වූ ඉන්දියාව එම ප්‍රාන්ත වල පවතින බදු වලින්ද නිදහස් විය යුතු ප්‍රධාන කාරණය ඉවත්කර ගැනීම සහ ඉන්දියාව ප්‍රාන්ත ගණනාවකින් සමන්විතව සහ ශ්‍රී ලංකාව තනි රටක් ලෙස ස්වාධීන රාජ්‍ය දෙකක් අතර එක සමාන බදු සහන ගිවිසුම් සමබරව සකස් නොවීම සිදු වූ බවයි.



Bilateral Free Trade Agreement between India and Sri Lanka

The two sides have held two rounds of negotiations on the Bilateral Free Trade Agreement. The enclosed draft Agreement reflect the status of negotiations. Agreement has been reached on all issues except for the following Articles and Annexures, which are subject to further negotiations:-

1. Article III(sub-clause 3)
2. Article X.
3. Annexures 'A' to 'F'

The draft Agreement reflecting the status of negotiations as on 15th December 1998 has been initialed by us today, the 15th December 1998.

For the Government of India

For the Government of Sri Lanka

කර්තෘ විසින් 1997 මාර්තු මාසයේ මාධ්‍යයේ පල කර තිබූ එළිදරව් කිරීම් සහ විවේචනයන්ගෙන් උපුටා ගනිමින් දැක්වූ තවත් රටේ මහත් ආන්දෝලනයක් ඇති කල කරුණක් වූයේ, සැක සහිත වංචනික ගනුදෙනුවක් වූ පුත්තලමේ සිමෙන්ති කම්හල පකිස්ථානයේ තාවක්කාල් සමාගමට විකිණීමේ ක්‍රියාවයි. එහිදී කර්තෘ විසින් පුත්තලම සිමෙන්ති කම්හල පකිස්ථානයේ තාවක්කාල් සමාගමට විකිණීම රජය විසින් සිදු කල නීතිවිරෝධී ආකාරය දත්ත සහිතව එළිදරව් කරන ලද අතර, එසේම එවකට විදේශ ඇමති ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර් මෙම ගනුදෙනුව ප්‍රසිද්ධියේ දරුණු සාහාසික අන්දමින් විවේචනය කොට, රජය මේ ගැන වහාම විමර්ශනයක් පැවැත්විය යුතු යයි තරයේ ප්‍රකාශ කර සිටින ලදී. කෙසේ වෙතත්, ඔහු එංගලන්තයේ ඔක්ස්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙක් වුවත්, එවැනි ප්‍රජාතන්ත්‍රවාදී පදනමක් මත ගරු කරමින්, සිත අමාත්‍ය ධුරයෙන් ඉල්ලා අස්වූයේ නැත. පසුව වාණිජ මහාධිකරණයේ පැවතී අංක 145/97 (1) දරණ සිවිල් නඩුවේදී මෙය මහා පරිමාණ වංචාවක් බවට තීන්දු වී මෙම ගනුදෙනුව නිශ්ප්‍රභා විය.

> " වෙළඳපොල තුල සිදුවන අකටයුත්ත නොඉවසන බව සහ එසේ සිදුවූ අකටයුතුකම් වරදක් පිළිබඳ නොසළකා හැර සිටිම හෝ එම අකටයුත්ත සදාකාලිකව රඳවා තබා ගැනීම (හෝ සාමාන්‍ය කතා ව්‍යවහාරයේදී ‘සුදු හුණු ගෑම‘) සිදු නොකරනු ඇත - යනුවෙන් මෙම රජය විසින් පවසන අදහස, මම දැඩි ලෙස මගේ සගයන් මත, ගෞරවයෙන් යුතුව, දේශීය හා විදේශීය පෞද්ගලික අංශය දෙකම වෙත එහි මූලික යෝග්‍යතාව පැහැදිලි කරමි. පුත්තලම සිමෙන්ති කටයුත්ත පිළිබඳව සිදුව ඇත්තේ රජය සහ රටේ මහජනතාව මත දල සහ සූදානම් සහිතව කරන ලද වංචාවකි. කොළඹ කොටස් වෙළඳපොල විරෝධය මග හරවා ගැනීමට උත්සාහ දරන්නේ යයි පවසමින් මෙම අමාත්‍ය මණ්ඩලය විසින් ඒ පිළිබඳ නොසළකා හැර සිටිය යුතු නොවේ. දිගු කාලීන කොටස් හුවමාරුව සහ සැක සහිත මාර්ගයෙන් පෞද්ගලික අංශයේ උත්තේජනය යන්නෙන්, පසුගිය රජය යටතේ සිදුවූ පරිදි මෙන් ජාතික යහපතට අනර්ථයක් වෙමින්, නැවත අපකීර්තියට ඇද වැටෙනු ඇත. “

ඉන්පසු ඒ ආකාරයටම කර්තෘ විසින් 1997 අගෝස්තු මාසයේ මාධ්‍යයේ පල කර තිබූ එළිදරව්වන් සහ විවේචනයන් උපුටා ගනිමින්, එමගින් දත්ත සහ සාධක සහිතව, ඉතාමත් සැක සහිත දූෂිත ලෙස ජාත්‍යන්තර ගුවන් තොටුපලේ පිහිටි මත්පැන් අලෙවි කිරීමේ ඒකාධිකාරී සහන වෙළඳපොල, එක්සත් රාජධානියේ ඇල්ෆා එයාර්පෝර්ට් සමුහ පීඑල්සී සමාගමට, රජයට සහ මහජනයාට අති විශාල අලාභයක් සිදුකරමින්, විකෘති අන්දමින් ප්‍රශ්නකාරී ලෙස අලෙවි කිරීම සහ ඒ පිළිබඳව ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග පත්කල නිලධාරීන් ක්‍රියාකල ආකාරයත් මනාසේ හෙළිදරව් කර ඇත.

**SALE and PURCHASE AGREEMENT**

BETWEEN

GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST
REPUBLIC OF SRI LANKA

AND

ALPHA AIRPORTS GROUP PLC

AND

ORIENT LANKA LIMITED

එලෙසම, කර්තෘ විසින් 1997 අප්‍රේල් මස මාධ්‍යයේ පල කර තිබූ එළිදරව්වන් සහ විවේචනයන් උපුටා ගනිමින්, එමගින් වානේ සංස්ථාව දකුණු කොරියාවේ දූශාන් සමූහ සමාගමකට, විනිවිද භාවයකින් තොරව, පෞද්ගලීකරණය කිරීමේ ගනුදෙනුවක් පිළිබඳවද දත්ත සහ සාධක සහිතව කරුණු කාරණා මනා ලෙස එළිදරව් කර ඇත.

තවද, කර්තෘ විසින් 1997 ජූලි මස මාධ්‍යයේ පල කර තිබූ එළිදරව්වන් සහ විවේචනයන් උපුටා දක්වමින්, ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර තිබූ මත්තේගම රෙදිපිළි කර්මාන්ත ශාලාවද දකුණු කොරියාවේ කාබුල් සමාගමට ඉහත කී ආකාරයටම විනිවිද භාවයකින් තොරව විකාර අන්දමින් ප්‍රශ්නකාරී පෞද්ගලීකරණයක් මත අලෙවිකරන ලද ආකාරය කර්තෘ විසින් සාධක සහ දත්ත සහිතව එළිදරව් කර තිබුණි.

එවැනිම තවත් කර්තෘ විසින් 1997 නොවැම්බර් මස මාධ්‍යයේ පල කර තිබූ එළිදරව්වන් සහ විවේචනයන් උපුටා දක්වමින්, රටේ මහත් ආන්දෝලනයක් ඇති කල ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ජපානයේ නිපොන් ටෙලිග්‍රාෆ් සහ ටෙලිෆෝන් සංස්ථාවට විකෘති ආකාරයකට සිදු කල ප්‍රශ්නකාරී පෞද්ගලීකරණය, කරුණු සහ දත්ත උපයෝගී කර ගනිමින්, පුදුම සහගත ලෙස කර්තෘ විසින් එළිදරව් කර තිබූ අතර එමගින්, මුලදී අලෙවි මිලකට

එකඟ වීමෙන් පසු, පිළිවෙලින් ඉදිරි අනාගතයේ පලමු වර්ෂ පහකට බඳු සහන සඳහා ඒකාධිකාරී අයිතිය, සහ වසරකට දුරකථන ගාස්තු, වසරක් පාසා 25%, 25%, 20%, 15%, සහ 15% වාර්ෂික දුරකථන ගාස්තු ඉහල නැංවීම සඳහා අයිතිය ලබා දෙමින්, එය රටේ මහජනතාවගේ උද්සෝෂණයකට හේතු විය. එසේ ලබා දීම මගින්, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ තක්සේරු කිරීම, ලංසු ක්‍රියාත්මක කාලයේ තක්සේරු කිරීම ඉක්මවා වර්ධනය කරමින්, සහ එවැනි ඒත්තු ගැන්විමක් ලංසු ලේඛනවල හෙලි කර නොමැතිව තිබූ අතර, සහ එසේ සිදු කලේ නම් පැතිරුණු ලංසු කැමැති පාර්ශවයන් ආකර්ශනය කර ගත හැකිව තිබුණි.

SRI LANKA TELECOM LIMITED

**SHARE PURCHASE AGREEMENT**

Between

THE GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
(acting through the Secretary to the Treasury)

and

NIPPON TELEGRAPH AND TELEPHONE CORPORATION

Dated 5th August 1997

කලින් ප්‍රධාන තක්සේරුකරු විසින්, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තක්සේරු කර තිබුණේ ප්‍රදානය කරනු ලැබූ ඉහත කී ඒත්තු ගැන්වීමේ කොන්දේසි පිළිබඳ දැනුවත් වීමකින් තොරව එම කරුණු ගණනයට නොගනිමිනි. ඒ අනුව ඉහත කී එවැනි ඒත්තු ගැන්වීමේ කොන්දේසි ඇතුලත් වී තිබුණි නම්, එම ආයතනයේ වටිනාකම ඊට පෙර ප්‍රධාන තක්සේරුකරු විසින් විකිණීම සඳහා ගණනය කර ගනුදෙනුව සඳහා තීරණය කළ වටිනාකමට වඩා, ස්වයංක්‍රීයව ඉමහත් ලෙස විශාල විය හැකිව තිබුණි. එමගින් පෙර තෝරා ගත් එම ජපන් සමාගම ධනවත් කිරීමටත්, රජයට සහ මහජනතාවට මහත් අලාභයක් කිරීම සිදුකර තිබුණි. මෙවැනි කොන්දේසි ප්‍රදානය කර දෙන බව එය අලෙවිකරණ අවස්ථාවට පෙර දැන්වීම් වල පල නොකර සිටීම බරපතල වරදක් වූ අතර, එය එසේ පලකර තිබුණා නම්, අලෙවියට තරගකාරිත්වයක් මත, වෙනත් වඩා කැමති පාර්ශවකරුවන් ගණනාවක් අනිවාර්යයෙන්ම ආකර්ශනය වී ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් හි කොටස් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වන්නට තිබුණි.

එවැනිම තවත් කලබලකාරී තත්වයක් රට තුල ඇති කල, 1997 දෙසැම්බර් මස මාධ්‍යයේ පල කර තිබූ එලිදරව්වන් උපුටා දක්වමින්, කර්තෘ විසින් විමර්ශනය කර විවේචනයට ලක්කර ඇත්තේ, ප්‍රංශයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට මිට පෙර මිලදී නොගත් GCE ඇල්ස්තම් සමාගමකින්, දුම්රිය එන්ජින් ලබා ගැනීමේ ආන්දෝලනාත්මක ගනුදෙනුව දත්ත සහ සාධක සහිතව සවිස්තරාත්මකව එළිදරව් කිරිමය. එකී ගනුදෙනුව ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංගගේ මැදිහත් වීම සහ අනුමැතිය සහිතව, GCE ඇල්ස්තම් මිලදී ගැනීම නිර්දේශ කරමින්, තිදෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද ටෙන්ඩර් මණ්ඩලයේ එක් සාමාජිකයකුගේ සුළුතර විසම්මුතිවාදී වාර්තාව සහිතව සිදු කරනු ලැබ ඇත.

**“ සුළුතර විසම්මුතිවාදී වාර්තාව**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ඩීසල් විදුලි දුම්රිය එන්ජින් 10 ක් මිලදී ගැනීම සඳහා වන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩල වාර්තාව

බි. සී. පෙරේරා මහතා
සභාපති
අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා ඩීසල් විදුලි දුම්රිය එන්ජින් 10 ක් මිලදී ගැනීම සඳහා වන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩල වාර්තාව

XXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXX

1. නිවැරදි ටෙන්ඩර් ඇගයීම් කියා පටිපාටි වලින් විතැන් වෙමින් කටයුතු කිරීම හේතුවෙන්, තාක්ෂණික ඇගයිම් කමිටුව (TEC) විසින් ඉදිරිපත් කල ඇතැම් නිර්දේශ සළකා නොමැත.

2. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා 1,451,021,460 ක මුදලකට ඩීසල් විදුලි එන්ජින් 10 ක් මිලදී ගැනීම සහ ඊට අදාළව සියලු අනුකූලතා දක්වන GCE ඇල්ස්තම් සමාගම විසින් ඉදිරිපත් කල ලංසුව පිළි ගැනීම

අත්සන් කෙළේ.
ජී. ඩී. සිරිල් ගුණපාල

අතිරේක. ජනාධිපති ලේකම්

1997 නොවැම්බර් 10 දින "

එවැනිම ආකාරයකට, එනම් කර්තෘ විසින් 1998 අප්‍රේල් මස මාධ්‍යයේ පල කර තිබූ එලිදරව්වන් උපුටා දක්වමින්, රටේ සහ පාර්ලිමේන්තුවේ මහා ආන්දෝලනයක් ඇති කල, එයාර් ලංකා ආයතනය එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ආයතනයකට පෞද්ගලීකරණය කිරීම කර්තෘ විසින් සවිස්තරව විමර්ශනය කොට, කරුණු කාරණා, සාධක සහ දත්ත ඉදිරිපත් කරමින්, එසේ සිදු කල එම ගනුදෙනුව විකෘතිභාවයකින් සහ විනිවිදභාවයකින් තොරව කල බවට කර්තෘ විසින් එලිදරව් කරනු ලැබ ඇත. මෙම ගනුදෙනුව පිලිබඳව එක්සත් ජාතික පක්ෂය විසින් එවකට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කොට තිබූ නමුත්, එයින් කිසි ප්‍රතිඵලයක් කිසිදු අයුරකින් අත්වූයේ නැත.

AIR LANKA LIMITED

SHARE SALE AND PURCHASE AGREEMENT

Between

THE GOVERNMENT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
(acting through the Secretary to the Treasury)
(as Seller)

and

EMIRATES, THE INTERNATIONAL AIRLINE OF THE U.A.E.
(as Purchaser)

Dated 30th March, 1998

IN WITNESS of which this document has been executed and delivered on the date which appears on page 1 above.


Signed in the presence of

Weerawarna Ranpatabendige Dixon Nilaweera
Secretary To The Treasury
For and on behalf of The Government of the Democratic Socialist Republic Of Sri Lanka

Name: D. P. B. Jayasundera
Title: Deputy Secretary to the Treasury GOSL

Sheikh Ahmad Bin Saeed Al-Maktoum
Chairman, Emirates,
the International Airline of the U.A.E.
For and on behalf of
Emirates, the International Airline of the U.A.E.

Name: MAURICE FLANAGAN
Title: MANAGING DIRECTOR EMIRATES



Present AirLanka route network 1997/98

තවදුටත්, කර්තෘ විසින් 2006 ජුනි මස මාධ්‍යයේ පල කර තිබූ එලිදරව්වන් උපුටා දක්වමින්, රටට සහ මහජනතාවට අලාභ විදින්නට හේතු වූ ඉන්දියන් තෙල් සමාගමට නුසුදුසු පරිදි ප්‍රතිලාභ ලැබෙන සේ, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල් වලින් හොඳම ඉන්ධන පිරවුම්හල් 100 අලෙවි කිරීමේ ගනුදෙනුව, විමර්ශනය කොට, විස්තරාත්මක කරුණු කාරණා, සාධක සහ දත්ත ඉදිරිපත් කරමින්, මනාසේ විවේචනය කොට ඇත.

තවදුරටත් අමාත්‍ය මණ්ඩල අනුමැතියේ කොන්දේසි වලට පටහැනිව, ක්‍රියාත්මක කල මෙම ගනුදෙනුව ශ්‍රී ලංකා රජයට විශාල අලාභයක් සිදුවීම, කර්තෘ විසින් එවකට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසමේ සභාපති ලෙස එය වළක්වාලමින් කටයුතු කළ නිසා, එවකට ශ්‍රී ලංකාවේ ඉන්දීය මහා කොමසාරිස්වරිය වූ නිරූපමා රාඕ ගේ බලපෑම් පවා හෙලා දකිමින්, ඔහු විසින් එසේ ක්‍රියා කළ ආකාරය මනාසේ අනාවරණය කර ඇත. තවත් හෙළිදරව් වූ විශේෂ කරුණක් වූයේ එවකට බලයට පත් ජනාධිපති මහින්ද රාජපක්ෂ කර්තෘ විසින් රටේ යහපත උදෙසා නොබියව කටයුතු කල කර්තෘගේ මෙම ක්‍රියාවලියට ප්‍රසංශා කරමින් ස්තුතිය පුද කිරීමය.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
**MINISTRY OF FINANCE AND PLANNING**

මහ ලේකම් කාර්යාලය, කොළඹ 01. செயலகம், கொழும்பு 01. The Secretariat, Colombo 01.

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையம் / Website: www.treasury. gov.lk

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date: 4th April, 2005

Chairman
Public Enterprise Reform Commission

Dear Sir,

**PAYMENT OF SUBSIDY TO LANKA IOC**

Lanka IOC has submitted several claims pertaining to the subsidy as per the pricing formula attached to the agreement signed between GOSL and LIOC.

Since you had already expressed concern over this pricing formula and the amount involved, I shall be grateful if you could examine their claims and make a suitable recommendation for the government for an early settlement of the outstanding amounts.

Since the formula prices have been computed on a rising market, it appears that the pricing formula has given much more return on investment than expected from such investment. I recall that you have made a strong argument in this regard. Therefore, please be kind enough to provide a suitable modification to the agreement.

Yours faithfully,

P B Jayasundera
**Secretary to the Treasury**

PUBLIC ENTERPRISES
RECEIVED
05 APR 2005
REFORM COMMISSION OF SRI LANKA

“ 2006 ජූනි මස 13 වන දින

අතිගරු නිරූපමා රාඕ
ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස්
36 - 38, ගාලු පාර,
කොළඹ 3.

අතිගරු කෙමසාරිස් තුමියනි,

**ඉන්දියානු තෙල් සංස්ථා සමාගම (IOC) / ලංකා IOC සමාගම (LIOC)**

XXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXX

අවසන් තීරණයේ දී, මෙම කරුණට අදාළව, අන්‍යොන්‍ය වශයෙන්, රාජ්‍ය තාන්ත්‍රික බලපෑම් සහ සියුම් වෙනස්කම්හි සන්දර්භය මත, සමහරවිට, ඩෙනින්ග් සාමිගේ විනිශ්චයෙන් උපුටා ගනු ලැබූ පහත සඳහන් උධෘතයන්, උචිත වනු ඇත. *(1977) 1 All ER @ 892*

> " එම ගැටුම සම්බන්ධයෙන් ප්‍රශ්න ගෙන එයි නම්, උදාහරණයක් වශයෙන්, විදේශ රජයක ව්‍යවස්ථාදායක හෝ ජාත්‍යන්තර ගනුදෙනු, හෝ එහි විධායක ප්‍රතිපත්තිය වැනි ලෙස, එහිදී මුක්තිය ප්‍රදානය කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුවහොත්, අධිකරණය විසින් එසේ සිදු කල යුතුය. මක් නිසාද යත්, වෙනත් රටක දේශීය අධිකරණයකදී සාකච්ඡා කෙරෙන, එවැනි ආරවුලක් හුරුවට ඇති කරුණක් මගින් විදේශීය රාජ්‍යයක ස්වෛරීභාවයේ අභිමානය උල්ලංඝනය කරනු ඇති බැවිනි.; නමුත් ආරවුල සැළකිය යුතු නම්, උදාහරණයක් වශයෙන්**,** විදේශ රජයේ වාණිජ ගනුදෙනු (එහිම දෙපාර්තමේන්තු සහ ආයතන විසින් හෝ වෙනම නීති ආයතන පිහිටුවා ඒ මත සිදු කෙරෙන්නේද යන්න)**,** සහ එය අප අධිකරණයේ භෞමික අධිකරණ බලය තුළ නිසි පරිදි පැන නගින්නේ නම්**,** කිසිදු අයුරකින් මුක්තිය ප්‍රදානය කිරීම සඳහා පදනමක් නොමැත - *රහිම්තෝලාට එරෙහිව හයිද්‍රාබාද් හි නිසාම්*
>
> *“ ........... එය මෙහි වෙළෙන්දකු සමග වාණිජ ගණුදෙනු වලට ඇතුලත් වන්නේ නම් සහ අපගේ භෞමික අධිකරණ බලය තුළ නිසි පරිදි වන ආරවුලක් මතු වී ඇතිනම්, විදේශ රාජ්‍යයන්හි ස්වෛරීභාවයට මුක්තියක් නොමැත. විදේශ රජයක් ලන්ඩන් වෙළෙඳපොළ මත පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම සඳහා වන නීතිමය ඒකකයෙහි ඇතුලත් නම්***,** *හෝ ප්‍රචාරණ පත්‍රය බෝල්ටික් විනිමය වෙළෙඳපොල මත වූ රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ලෝකයේ වෙළඳපොල තුලට ඇතුලත් වන්නේ නම්, සහ ජාත්‍යන්තර කම්ටුවක් අවශ්‍ය වන්නේ නම්, එය වෙළඳපොල නීතිරීති මගින් බැඳිය යුතුය. “ - තායි-යුරෝප් ටපියොකා සර්විස් ලිමිඩ් එදිරිද පකිස්ථානු රජය*

XXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXXX

අතිගරු ජනාධිපතිතුමන් එසේ මැදිහත් වන බැවින්, IOC විසින් එහි මූලික බැඳීම් ඉටු කරන බවට සහ විදේශ විනිමයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 35 ක කොටසක ඉතිරි ආයෝජන ගෙන ඒමට කැපවීම තහවුරු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් මා අයැද සිටිමි.


**ඔබගේ විශ්වාසී,**

නිහාල් ශ්‍රී අමරසේකර

පිටපත්: ලේකම්, මුදල් අමාත්‍යාංශය
ගරු. විදේශ කටයුතු අමාත්‍ය
අතිගරු ජනාධිපති

තවද, කර්තෘ විසින් 1998 නොවැම්බර් මස මාධ්‍යයේ පල කර තිබූ 'වතු මංකොල්ලකෑම' පිළිබඳ තවත් ගනුදෙනුවක් උපුටා දක්වමින්, හොංකොං සමාගමකට ප්‍රශ්නාකාරී මිලකට රජයේ ඉඩමක් පවරා දීම එළිදරව් කර ඇත.

එපමණක් නොව, රටේ මහත් ආන්දෝලනයක් ඇති කල කොළඹ වෝටර්ස් එජ් නමින් හැඳින් වූ ගොල්ෆ් ව්‍යාපෘතියේ ගනුදෙනුව, කර්තෘ විසින් කරුණු කාරණා සාධක සහිතව අදාල ලේඛන සහ දත්ත ඇතුලත් කරමින් ඉදිරිපත් කර ඇත. මෙම මහා පරිමාණ වංචා සහ දූෂණ ගනුදෙනුව පිළිබඳ කර්තෘ විසින් අදාල දත්ත, සාධක සහ ලේඛන ඉදිරිපත් කරමින් කටයුතු කර ඇති අතර, ප්‍රතිඵලය ලෙස හිටපු ජනාධිපතිනිය චන්ද්‍රිකා කුමාරතුංගද ඇතුළුව, ප්‍රභූවරුන් හවුල්වී සිටි, එම ගනුදෙනුව දැඩි දෝෂාරෝපණයට ලක්කොට, ශ්‍රේෂ්ඨාධිකරණයේ අංක 352/2007 දරණ නඩුවේ ඓතිහාසික නඩු තීන්දුවකින් එම ගනුදෙනුව නිශ්ප්‍රභා කර අවලංගු කර තිබුණි. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංගට රු.මි. 3.0 දඩ මුදලක්ද, තවත් වැරදිකරුවෙකුට රු.මි. 2.0 ක සහ අනෙක් වැරදිකරුවන්ට රු.මි. 1.0 ක දඩ මුදල බැගින් ගෙවීමට නියම වූ ආකාරය මෙම පරිච්ඡේදයෙන් මැනවින් එළිදරව් කර ඇත.



මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

FPE/DP/02/65'(23)

ඔබේ අංකය
Your No.

The Secretariat, Colombo 01

TRUE COPY
Attorneys-at-Law for Petitioner

CABINET MEMORANDUM

*Ministry of Finance & Planning*

RELEASE OF LAND ON CONCESSIONARY TERMS - ASIA PACIFIC GOLF COURSES LTD.

On 14th May 1997, Board of Investment approved a proposal submitted by Asia Pacific Golf Courses Ltd. (APGC) to set up an 18-hole Golf Course of international standards within a 136 acre block of land at Battaramulla, belonging to the UDA In addition, the investors have proposed the construction of a park, football pitch, cricket pitch and a hawker centre for the purpose of selling food items, which will be made available to the public.

XXXXXXXXXXXXXXXXXXXX

Accordingly, I recommend that this land be allocated on the basis of lease rent being calculated at 2% of market value as determined by the Chief Valuer during the first five years and 4% thereafter, in keeping with the Cabinet decision of 08th October 1997.

XXXXXXXXXXXXXXXXXXXX

Chandrika Bandaranaike Kumaratunga
Minister of Finance & Planning

09th February 1998.

මීට අමතරව, මෙම ග්‍රන්ථයේ තවත් පරිච්ඡේදයකින් ශ්‍රේෂ්ඨාධිකරණයේ එස්සී (එෆ්ආර්) අංක 503/2005(FR) දරණ අයැදුමෙහි ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විශ්‍රාම යැමත් සමග, විශ්‍රාමගත් ජනාධිපතිවරයෙකුට හිමිවිය යුතු වරප්‍රසාද කුමක්දැයි ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් මගින් නිගමනය කිරීම පිළිබඳවද විශ්ලේෂණාත්මකව කර්තෘ විසින් අනාවරණය කර ඇත.

ඉහත කී ප්‍රකාර 1995 සිට 1999 වකවානු වල සිදුවූ දූෂිත ගනුදෙනු එසේ පැවති අතරම, ඊට පෙර රජය විසින් පෞද්ගලීකරණය කල නයිලෝන් 6 නැමති කර්මාන්ත ශාලාවක යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය පිළිබඳ, විමර්ශනය කිරීමට ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විසින්ම විශේෂ ජනාධිපති කොමිසමක් පත්කර විමර්ශනය කරන ලදී. එය වැරදි සහගත බවත්, එයින් රජයට විශාල අලාභයක් සිදුවූ බවත් සනාථ වූ බවට නිගමනය කරමින්, නිගමනය ලබා දීමට ප්‍රථම ඊට අදාල වගකිව යුතු ඇමතිවරයෙකු මිය ගොස් සිටි බැවින්, විශේෂ ජනාධිපති කොමිසම මගින් නිගමනයක් ලබා නොදුන් අතර, කෙසේ වෙතත් එක් පරීක්ෂණයකදී ඊට අදාල වූ අමාත්‍යාංශයේ ලේකම්වරයකුට එරෙහිව නියෝග කරමින් එකී අමාත්‍යාංශ ලේකම්වරයාගේ ප්‍රජා අයිතිවාසිකම අහෝසි කරන ලදී.

Sinhala and Tamil versions of this Report will be printed separately.

SESSIONAL PAPER NO. I – 1997

**FOURTH INTERIM REPORT SUBMITTED TO HER EXCELLENCY THE PRESIDENT BY THE SPECIAL PRESIDENTIAL COMMISSION OF INQUIRY, 1995 APPOINTED TO INQUIRE INTO ALLEGED MALPRACTICES IN CERTAIN GOVERNMENT BODIES**

*Printed on the orders of the Government*

**2nd March, 1997**

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA.

TO BE PURCHASED AT THE GOVERNMENT PUBLICATIONS BUREAU, COLOMBO 07.

**Price : Rs. 120.00** **Postage : Rs. 10.00**

1—D 044754–1,893–(21/06)



**Justice H.S. Yapa** **Justice P.R.P. Perera** **Justice F.N.D. Jayasuriya**

ඉහත කී විමර්ශනය ගවේෂණය කොට, කරුණු ඉදිරිපත් කර තිබූ පරිදි, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග එක්සත් රාජධානියෙන් මෙරටට ගෙන්වා ගනු ලැබූ ඇයගේ සමීපතම සගයෙකු වූ රාජන් බ්‍රිටෝ, මවිතයට පත්කරවන ලෙස ඉහතකී සමහර ගනුදෙනු ක්‍රියාත්මක කිරීමට ඔහුගේ දායකත්වය, අනුග්‍රහය සහ අනුබලය ලබා ගැනීම ඛේදජනක කරුණක් නොවන්නේද ? එවැනි අයට සහ ඊට මැදිහත් වූ අයට එරෙහිව විරුද්ධව ඉහත කී ලෙස සමානව නීතියේ ආධිපත්‍යය ක්‍රියාත්මක නොවූයේ, දේශපාලන බලය සහිත වූ ඉහල සමාජයේ යථාර්ථය මැනවින් පිලිඹිබු කරමිනි.

ඉහත කී ප්‍රකාර සවිස්තරව කරුණු කරණා, දත්ත සහ ලේඛන ඇතුලත්ව විස්තරාත්මකව මෙම වංචනික සහ දූෂිත ගනුදෙනු මාධ්‍යයේ පලකර තිබිණි. එසේ තිබියදීත්, එම වැරදි ක්‍රියාවලට එරෙහිව නීතියේ ආධිපත්‍යය ක්‍රියා කිරීමට බලයට පත් වූ රජයන් අපොහොසත් වී ඇති අතරම, නීතිය බලාත්මක වන ආයතන එවැනි වංචා සහ දූෂිත ගනුදෙනු පිළිබඳ කිසිම ක්‍රියා මාර්ගයක් නොගැනීම, සමාජයේ ඉහත කී ප්‍රකාර දේශපාලනික සහ උසස් සමාජයේ ක්‍රියාකාරකම් වල යථාර්ථය බව මැනවින් සහ සත්‍ය ලෙස හෙළි දරව් වේ. ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දු ඉදිරියේ පවා එම තීන්දු මගහරිමින් ඉහත කී බලාත්මක ආයතන ඒ අනුව ක්‍රියා නොකරන ලද්දේ මන්දැයි යන්න පුදුම සහගත කරුණක් නොවන්නේද ?

ඊටත් වඩා පුදුම සහගත වන්නේ, ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග විශේෂ ජනාධිපති කොමිසමක් පත්කර, එමගින් පෙර රජය විසින් සිදු කල වංචා සහ දූෂණ විමර්ශනය කරන වකවානුව තුලම, ඇය විසින් පත්කල ඇයගේ සගයන් වන නිලධාරීන්, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම මගින් ඉහත කී දූෂිත සහ වංචනික පෞද්ගලීකරණයන් එම කාලය තුලදීම සිදුකිරීම සහ ඇයගේ බලය යටතේ එවැනි අවස්ථාවන්හිදී එයට එරෙහිව නිසි පරිදි නිතියේ ආධිපත්‍යය බලාත්මක නොකිරීම පුදුමයට පත්වන කරුණක් නොවන්නේද ?

තවද බලය තුල සමාජ දේශපාලන හේතු මත, ඉහළ සමාජයේ වංචනිකයන්ට සහ දූෂිතයන්ට එරෙහිව නීතියේ ආධිපත්‍යය බලාත්මක නොවන දෙබිඩි පිළිවෙල සහ කුහකත්වය, මැනවින් සනාථ වන කරුණකි.

*වැඩි විස්තර සඳහා පිවිසෙන්න : [http://www.consultants21.com/fraud-&-corruption-exposures-new.php](http://www.consultants21.com/fraud-&-corruption-exposures-new.php)*